140

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය
කළමනාකරණ අධ්‍යයන පීඨය
මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව
**HRC2406 - මානව සම්පත් කළමනාකරණය සඳහා කුසලතා**
අවසාන විභාගය - 2024
කාලසීමාව - පැය තුනකි (03)

---

දිනය: 20/10/2024 වේලාව: ප.ව 01.30 සිට ප.ව. 04.30

---

උපදෙස්:

- මෙම ප්‍රශ්න පත්‍රය රචනා ප්‍රශ්න වලින් සමන්විත වන අතර එයට හිමි ලකුණු සංඛ්‍යාව 100 කි.
- ප්‍රශ්න හයෙන් ඕනෑම ප්‍රශ්න හතරකට ( 04) පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු 25ක් ඇත.
- ලබා දී ඇති පිළිතුරු පොතෙහි අදාළ ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- කියවිය නොහැකි අත් අකුරු සඳහා ලකුණු අඩු විය හැක.

---

**ප්‍රශ්න අංක 01**

"ස්ටීවන් කවී විසින් විස්තර කරන ලද ඉතා ඵලදායී පුද්ගලයින්ගේ පුරුදු 7", ඔබේ දෛනික ජීවිතයෙන් උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (7 habits of highly effective people by Stephen Covey).

(ලකුණු 25)

**ප්‍රශ්න අංක 02**

"ජීවිතයේ විවිධ අභියෝග සහ දුෂ්කරතාවලට මුහුණ දෙන පුද්ගලයන්ට උපකාර කිරීමේදී උපදේශනය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි" සේවක උපදේශනයෙන් ආයතන මෙන්ම සේවකයින් සැලකිය යුතු ලෙස ප්‍රතිලාභ ලබන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 25)

**ප්‍රශ්න අංක 03**

මෘදු කුසලතා යනු කුමක්ද යන්න පැහැදිලි කර, ප්‍රධාන මානව සම්පත් කළමනාකරණ කාර්යයන් හතරක් තෝරාගෙන එම එක් එක් මානව සම්පත් කළමනාකරණ කාර්යය සඳහා වෘත්තිකයන් බෙහෙවින් භාවිතා කරන මෘදු කුසලතා පිළිබඳ උදාහරණ සපයන්න.

(ලකුණු 25)

**ප්‍රශ්න අංක 04**

"නූතන වේගවත් වැඩ පරිසරය තුළ, ආයතනයක ඕනෑම තරාතිරමක කළමනාකරුවෙකු ලෙස හොඳින් ක්‍රියා කිරීමට ඇති වැදගත්ම කුසලතා වන්නේ තාක්ෂණික කුසලතා වේ" ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟද? උදාහරණ සමඟ ඔබේ හේතු පැහැදිලි කරන්න.

(ලකුණු 25)

**ප්‍රශ්න අංක 05**

"ආතතිය මෘදු වූ විට, එය ප්‍රයෝජනවත් විය හැකි අතර ආතතිය දැඩි වූ විට එය සෘණාත්මක බලපෑම් ඇති කළ හැකිය". සේවකයාගේ දෘෂ්ටි කෝණයෙන් උදාහරණ සමඟ ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

**(ලකුණු 25)**

**ප්‍රශ්න අංක 06**

"ඉහළ කාර්ය සාධනයක් ලබා ගැනීම වැදගත් වේ, නමුත් සදාචාරාත්මක කාර්ය සාධනය වඩා වැදගත් වේ". ඉහත ප්‍රකාශය සඳහන් කරමින් මානව සම්පත් කළමනාකරණයේ ආචාර ධර්ම (Ethics in HRM) පිළිබඳව වෘත්තිකයන් විසින් සලකා බැලිය යුත්තේ මන්දැයි උදාහරණ සමඟින් පැහැදිලි කරන්න.

**(ලකුණු 25)**

**(ලකුණු 25*ප්‍රශ්න 04 = මුළු ලකුණු 100)**

**- ප්‍රකාශන හිමිකම් ඇවිරිණි -**